5931

AL/2010/28-S-I

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

28 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ගෘහ ආර්ථික විද්‍යාව I
மனைப் பொருளியல் I
**Home Economics I**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

විභාග අංකය ............................

- ✻ මෙම ප්‍රශ්න පත්‍රය 'අ' සහ 'ආ' යනුවෙන් කොටස් **දෙකකින්** යුක්ත වේ.
  කොටස් දෙකට ම නියමිත කාලය පැය **තුනකි**.
- ✻ 'අ' කොටසේ **1** වැනි ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක්** ද 'ආ' කොටසේ **8** වැනි ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්නයක් ද තෝරා ගෙන ප්‍රශ්න **හතකට** පිළිතුරු සපයන්න.
- ✻ 'අ' කොටසේ **1** වැනි ප්‍රශ්නයටත් 'ආ' කොටසේ **8** වැනි ප්‍රශ්නයටත් පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා වෙන් කොට, ඒවා සෙසු ප්‍රශ්නවල පිළිතුරු සමඟ අමුණා භාර දෙන්න.
- ✻ මෙම ප්‍රශ්න පත්‍රය කඩදාසි **දෙකකින්** යුක්ත වන අතර, අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව **10** කි.
- ✻ **පළමුවැනි** ප්‍රශ්නය **1** සහ **2** පිටුවලත්, අටවැනි ප්‍රශ්නය **5** සහ **6** පිටුවලත් ඇත.

## 'අ' කොටස - පෝෂණය

**පළමුවැනි** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. එක් එක් ප්‍රශ්නය සඳහා අදාළ පිළිතුරෙහි අංකය හෝ පිළිතුර හෝ තිත් ඉර මත ලියන්න.

1.1 මාෂබෝගවල ඌන ඇමයිනෝ අම්ලයකි,
(1) මෙතියොනින්. (2) වැලයින්. (3) ලයිසීන්.
(4) සිස්ටීන්. (5) ලියුසීන්. (............)

1.2 හීම් යකඩ අඩංගු **නොවන** ආහාර ද්‍රව්‍යයකි,
(1) මස්. (2) මාළු. (3) බිත්තර.
(4) කිරි. (5) පිකුදු. (............)

1.3 සිරුරෙහි කැල්සියම් අවශෝෂණය කෙරෙහි බලපෑමක් ඇති **නොකරන** සාධකයකි,
(1) තන්තු. (2) ලැක්ටෝස්. (3) විටමින් D.
(4) ඔක්සැලික් අම්ලය. (5) ෆයිටික් අම්ලය. (............)

1.4 ගලගණ්ඩය ඇතිවීම කෙරෙහි හේතු විය හැකි ආහාර ද්‍රව්‍ය **දෙකකි,**
(1) රාබු හා තිරිඟු. (2) ගෝවා සහ තිවිති. (3) මඤ්ඤොක්කා සහ ගෝවා.
(4) තක්කාලි සහ රාබු. (5) බණ්ඩක්කා සහ මඤ්ඤොක්කා. (............)

1.5 පෝෂ්‍ය පදාර්ථ පරිවෘත්තියේ දී නිපදවෙන ශක්තිය ගබඩා කරන අධිශක්ති සංචිත හඳුන්වනුයේ ..............
.......................... අණු ලෙස ය.

[ දෙවැනි පිටුව බලන්න.

- අංක 1.6 සිට 1.10 තෙක් වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද අදාළ **කොටුව තුළ** ලකුණු කරන්න.

1.6 අග්න්‍යාශයික යුෂයෙහි අඩංගු වන පෙප්ටිඩේස්, ප්‍රෝටීන් ජීර්ණය සඳහා ක්‍රියා කරන එන්සයිමයකි. ☐

1.7 තයිරොක්සින් ඌන වූ විට පුද්ගලයෙකුගේ සිරුරෙහි මූලස්ථ පරිවෘත්තික වේගය අඩු වේ. ☐

1.8 ධාන්‍යවල, ඇමයිලෝස් සහ ඇමයිලොපෙක්ටින් යන කාබොහයිඩ්‍රේට අඩංගු වේ. ☐

1.9 ග්ලයිකොජන් සෑදී ඇත්තේ ග්ලූකෝස් හා ෆෘක්ටෝස් යන මොනොසැකරයිඩ සංයෝග වීමෙනි. ☐

1.10 මස්වල සම්බන්ධක පටකවල ඉලාස්ටින් නම් ප්‍රෝටීනය අඩංගු වේ. ☐

1.11 මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවෙකු උසට සරිලන බර නොමැති බව පෙන්නුම් කරන ලදී. මෙම තත්ත්වය නම් කරන්න.

..........................................................................................................

1.12 බිත්තරවල අඩංගු වන ප්‍රෝටීන **දෙකකි**, .................................... හා ....................................

1.13 එළකිරිවල පෝෂණ අගය පිළිබඳව ශිෂ්‍යාවක විසින් ලියන ලද සටහනකින් උපුටා ගත් කරුණු කිහිපයක් පහත දැක්වේ.

A - අංග සම්පූර්ණ ආහාරයකි.
B - අඩංගු වන කැල්සියම් පහසුවෙන් අවශෝෂණය කරගත හැකි අයුරින් පවතී.
C - විටමින් C හා D වලින් සරු ආහාරයකි.
D - ජෛව අගයෙන් උසස් ප්‍රෝටීන අඩංගු ය.
E - මෝල්ටෝස් හා ලැක්ටෝස් වැනි කාබොහයිඩ්‍රේට අඩංගු වේ.

මේවායින් නිවැරදි වනුයේ

(1) A හා C ය. (2) A,B හා E ය. (3) A,C හා E ය.
(4) B හා D ය. (5) D හා E ය. (............)

- **A** තීරයෙහි දැක්වෙන බණ්ඩයට වඩාත් ම ගැළපෙන බණ්ඩය **B** තීරයෙන් තෝරා, අදාළ පිළිතුරෙහි **අංකය කොටුව තුළ ලියන්න**.

| A | | B |
|---|---|---|
| 1.14 විටමින් C | ☐ | 1. කොලෙස්ටරෝල් මගින් නිපදවයි. |
| 1.15 විටමින් A | ☐ | 2. සම්බන්ධක පටකවල කොලැජන් නිපදවීමට උපකාර වේ. |
| 1.16 විටමින් K | ☐ | 3. ශරීර වර්ධනය මෙන් ම අස්ථි වර්ධනයට ද අවශ්‍ය ය. |
| 1.17 විටමින් D | ☐ | 4. අන්ත්‍ර තුළ සිටින බැක්ටීරියා මගින් නිපදවා ගනියි. |
| | | 5. බහු අසන්තෘප්ත මේද අම්ල අඩංගු ශාකමය ආහාරවල බහුල ය. |
| | | 6. ආහාර පරිවෘත්තිය සඳහා අවශ්‍ය වේ. |

1.18 'ස්ථූලතාව' හඳුන්වන්න.

..........................................................................................................

..........................................................................................................

1.19 ටොකොෆෙරෝල් යන රසායනික නාමයෙන් හැඳින්වෙනුයේ කුමන විටමිනය ද?

..........................................................................................................

1.20 'කිලෝ කැලරිය' නිර්වචනය කරන්න.

..........................................................................................................

**

[ තුන්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

28 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ගෘහ ආර්ථික විද්‍යාව I
மனைப் பொருளியல் I
**Home Economics I**

* මෙම ප්‍රශ්න පත්‍රය 'අ' සහ 'ආ' යනුවෙන් කොටස් **දෙකකින්** යුක්ත වේ.
  කොටස් **දෙකට** ම නියමිත කාලය පැය **තුනකි**.
* 'අ' කොටසේ **1** වැනි ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක්** ද 'ආ' කොටසේ **8** වැනි ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්නයක් ද තෝරා ගෙන ප්‍රශ්න **හතකට** පිළිතුරු සපයන්න.
* 'අ' කොටසේ **1** වැනි ප්‍රශ්නයටත් 'ආ' කොටසේ **8** වැනි ප්‍රශ්නයටත් පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා වෙන් කොට, ඒවා සෙසු ප්‍රශ්නවල පිළිතුරු සමඟ අමුණා භාර දෙන්න.
* මෙම ප්‍රශ්න පත්‍රය කඩදාසි **දෙකකින්** යුක්ත වන අතර, අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව **10** කි.
* **පළමුවැනි** ප්‍රශ්නය **1** සහ **2** පිටුවලත්, අටවැනි ප්‍රශ්නය **5** සහ **6** පිටුවලත් ඇත.

'අ' කොටස - පෝෂණය

**පළමුවැනි** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**2.** පහත සඳහන් ආහාර පුරුදු පුද්ගලයෙකුගේ පෝෂණ තත්ත්වය කෙරෙහි බලපාන අයුරු **විමසන්න**.
   (i) නිවුඩිඩ සහිත සහල් පරිභෝජනයට ගැනීම
   (ii) වැඩිපුර පලතුරු සහ පලාවර්ග නිතිපතා ආහාර වේලෙහි අඩංගු කිරීම
   (iii) බිත්තර කහමදය පරිභෝජනය සීමා කිරීම
   (iv) අච්චාරු, සෝස් වැනි පරිරක්ෂිත ආහාර නිතර ආහාරයට ගැනීම

**3.** පහත සඳහන් ද සන්සන්දනය කරන්න.
   (i) ග්ලූකෝස් හා සෙලියුලෝස්
   (ii) ගැඹුරු තෙලෙහි බැදීම හා පෝරණුවේ පිළිස්සීම
   (iii) සුක්රෝස් හා ලැක්ටෝස්
   (iv) සංවෘත්තිය හා අපවෘත්තිය

**4.** (i) දුෂ්පෝෂණය හඳුන්වන්න.
   (ii) ප්‍රරෝහණය වූ මුං බීජ ආහාර වේලට ඇතුළත් කර ගැනීමේ වැදගත්කම පහදන්න.
   (iii) යොවුන්වියේ දරුවන් සඳහා සුවිශේෂී ව සැපයිය යුතු පෝෂක නම් කර, එසේ සැපයීමට හේතු වන කරුණු දක්වන්න.
   (iv) යොවුන් අවධියේ දරුවන් සඳහා යෝග්‍ය දිවා ආහාර වේලක් සැලසුම් කරන්න. ඔබේ තේරීමට හේතු දක්වන්න.

**5.** (i) මහලුවියේ පසුවන්නන් සඳහා ආහාර ලබා දීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු සඳහන් කරන්න.
   (ii) නිර්මාංශ ආහාරවලින් යැපෙන්නන්ගේ ආහාර වේල් සඳහා කිරි සහ කිරි ආහාර එකතු කර ගැනීමේ වැදගත්කම පහදන්න.
   (iii) පහත සඳහන් වන්නේ ආහාර සකස් කිරීමේ දී අනුගමනය කරන පියවර කිහිපයකි. ඒවාට හේතු වන කරුණු විස්තර කරන්න.
      (a) මස් හා මාළු පිසීමට පෙර කුළුබඩු වර්ග මිශ්‍රකර ටික වේලාවක් තැබීම (මැරිනේට් කිරීම)
      (b) කේක් පිළිස්සීම ආරම්භ කර විනාඩි 15 ක් පමණ ගතවනතුරු පෝරණුවේ දොර විවෘත නොකිරීම
      (c) පලතුරු සලාදයක් සකස් කිරීමේ දී ඇපල් හා කෙසෙල් අවසානයේ දී එක් කිරීම

[ හතරවැනි පිටුව බලන්න.

6. (i) රසායනික හේතු නිසා ද ආහාර නරක්වීම සිදු වේ. එවැනි අවස්ථාවක් සඳහන් කර, එහි දී සිදුවන ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

(ii) ආහාර සැකසීමේ දී ප්‍රයෝජනවත් වන ක්ෂුද්‍රජීවී විශේෂයක් නම් කර, එහි ක්‍රියාකාරිත්වය විස්තර කරන්න.

(iii) සටහන් ලියන්න.

(a) බ්ලාන්ච් කිරීම

(b) පැස්ටරීකරණය

(c) ජෙලටිනීකරණය

7. ප්‍රජාව තුළ පෝෂණ ගැටලු පැවතීම රටක සංවර්ධනයට බාධා ඇති කරයි.

(i) ශ්‍රී ලංකාවේ පවත්නා පෝෂණ ගැටලු **තුනක්** නම් කරන්න.

(ii) ඔබ සඳහන් කළ එක් පෝෂණ ගැටලුවක රෝග ලක්ෂණ **දෙකක්** සඳහන් කර, ඒවා පිළිබිඹු කිරීමට මෙම ඌනතාව බලපාන අයුරු පැහැදිලි කරන්න.

(iii) පෝෂණ ගැටලු පැවතීමට හේතු වී ඇති කරුණු **තුනක්** විස්තර කරන්න.

(iv) පවුලේ පෝෂණ තත්ත්වය නඟා සිටුවීම සඳහා ගෘහ ආර්ථික විද්‍යාව හදාරන්නෙකු වශයෙන් ඔබ ගන්නා ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න.

The National e-learning Portal for The General Education

[ පස්වැනි පිටුව බලන්න.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු

(28) ගෘහ ආර්ථික විද්‍යාව I

විභාග අංකය ..............................

'ආ' කොටස - ළමා සංවර්ධනය

අටවැනි ප්‍රශ්නයට සහ තවත් **එක්** ප්‍රශ්නයකටත් පිළිතුරු සපයන්න.

8. එක් එක් ප්‍රශ්නය සඳහා අදාළ පිළිතුරෙහි අංකය හෝ පිළිතුර හෝ **තිත් ඉර මත** ලියන්න.

8.1 කලල බන්ධයෙන් (වැදෑමහ) ඉටු වන කෘත්‍ය **දෙකක්** ලියන්න.

(i) ..............................................................................................

(ii) ..............................................................................................

8.2 රුධිර පරීක්ෂණයක් කර ගැනීම විවාහාපේක්ෂිත යුවලකට විශේෂයෙන් වැදගත් වීමට හේතු වන කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(i) ..............................................................................................

(ii) ..............................................................................................

8.3 මව්කිරි නිෂ්පාදනය හා ස්‍රාවය වීම උත්තේජනය කරනුයේ

(1) ලැක්ටැල්බියුමින් මඟිනි.
(2) ඉමියුනෝග්ලොබියුලින් මඟිනි.
(3) ප්‍රොලැක්ටින් මඟිනි.
(4) ලැක්ටොග්ලොබියුලින් මඟිනි.
(5) ඕවොඇල්බියුමින් මඟිනි. (............)

- අංක 8.4 සිට 8.8 තෙක් වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද අදාළ **කොටුව තුළ** ලකුණු කරන්න.

8.4 දරුවෙකුගේ ස්ත්‍රී පුරුෂ භාවය තීරණය වීම කෙරෙහි බලපානුයේ පියාගේ ලිංගික වර්ණදේහ පමණි. ☐

8.5 පූර්ව ප්‍රසව අවධියේ මුල් කාලයේ සිට ම භ්‍රෑණයේ හෘද ස්පන්දන වේගය මැන ගත හැකි ය. ☐

8.6 කිරි උරා බීම තවජ බිළිඳු දක්වන ප්‍රතිකයකි. ☐

8.7 මුල් ළමාවියෙහි දරුවන්ට කාලය පිළිබඳ සංකල්පය පැහැදිලි ය. ☐

8.8 කෝපාවේගය පිළිබිඹු කිරීම ළමාවියෙහි ස්වභාවික ගති ලක්ෂණයකි. ☐

8.9 දරුවෙකුගේ සංවර්ධනය සඳහා බලපාන ප්‍රධාන සාධක දෙක වනුයේ, ආරය සහ .............................. යි.

8.10 පූර්ව ප්‍රසව අවධියට අයත් කාලසීමාව නැතහොත් මවගේ ගර්භිණී අවධියට අයත් කාලසීමාව සාමාන්‍යයෙන්

(1) සති 36 කි.
(2) සති 38 කි.
(3) සති 40 කි.
(4) සති 42 කි.
(5) සති 44 කි. (............)

8.11 ජානමය හේතු නිසා භ්‍රෑණයෙහි ඇතිවිය හැකි ආබාධ තත්ත්ව **දෙකක්** ලියන්න.

(i) ..............................................................................................

(ii) ..............................................................................................

8.12 ගර්භිණී මවකගේ පූර්ව ප්‍රසව සායන වාර්තාවල අඩංගු වූ කරුණු කිහිපයක් පහත දැක්වේ.

A - රුධිර හීමොග්ලොබින් මට්ටම ග්‍රෑම් 11 / මිලිලීටර 100 කි.
B - නිතර මුත්‍ර පිටකිරීමේ අවශ්‍යතාව ඇත.
C - නිරාහාර රුධිර ග්ලූකෝස් මට්ටම මිලිග්‍රෑම් 85 / මිලිලීටර 100 කි.
D - ගර්භිණී කාලය තුළ බර වැඩි වීම කිලෝග්‍රෑම් 6 කි.
E - අධික වමනය සහ ඔක්කාර ගතියෙන් පෙළෙයි.

මේ අතුරින් වෛද්‍යාධාර පැතිය යුතු කරුණු වනුයේ

(1) A හා B ය.
(2) A හා C ය.
(3) B හා C ය.
(4) C හා E ය.
(5) D හා E ය. (............)

8.13 යකඩ, මව්කිරිවල ඌන පෝෂකයකි. ඉපදී පළමු මාස කිහිපය තුළ බිළිඳු තමාගේ යකඩ අවශ්‍යතාව සපුරා ගන්නේ කෙසේ ද?

..............................................................................................................

..............................................................................................................

8.14 ගර්භිණී මවකගේ පාදවල ඉදිමුණු ස්වභාවයක් දක්නට ලැබුණි. මෙයට හේතු විය හැකි කරුණු **දෙකක්** ලියන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

8.15 'ප්‍රාග්පරිණත දරුවා' හඳුන්වන්න.

..............................................................................................................

..............................................................................................................

8.16 ආඥාදායක පරිසරයක වැඩෙන යොවුන් දරුවෙකු පිළිබිඹු කරන හැසිරීම් රටා **දෙකක්** සඳහන් කරන්න.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

8.17 ගර්භිණී අවධියේ අවදානම් සාධක දෙකක් ලෙස සැලකෙනුයේ මවගේ උස හා බර පිළිවෙළින් .............. හා ......................... ට වඩා අඩු වූ විට ය.

8.18 දරුවෙකුගේ සංවර්ධන ක්‍රියාවලිය හිසේ සිට පාදාන්තය දක්වා සිදු වේ. මෙය සනාථ කිරීමට උදාහරණයක් ලියන්න.

..............................................................................................................

..............................................................................................................

8.19 මුල් ළමාවියෙහි පසුවන දරුවන්ගේ කායික වර්ධනය කෙරෙහි මහත් පිටුවහලක් වන ක්‍රියාකාරකම් දැක්වෙන කාණ්ඩය වනුයේ

(1) වැලිපිල්ලේ ලිවීම, පඩි නැගීම හා මැටිවලින් ඇඹීමයි.
(2) බෝලය ඇල්ලීම, ඔන්චිලි පැදීම හා පඩි නැගීමයි.
(3) කැලිවලින් රූප ගොඩනැගීම, ගල් කැට ඇහිදීම හා ට්‍රයිසිකල් පැදීමයි.
(4) ඔන්චිලි පැදීම, චිත්‍ර ඇඳීම හා කැලිවලින් රූප ගොඩනැගීමයි.
(5) වැලිපිල්ලේ ලිවීම, බෝලය ඇල්ලීම හා මැටිවලින් ඇඹීමයි. (............)

8.20 'සමාජානුයෝජනය' හඳුන්වන්න.

..............................................................................................................

..............................................................................................................

* *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**28 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ගෘහ ආර්ථික විද්‍යාව I
மனைப் பொருளியல் I
**Home Economics I**

'ආ' කොටස - ළමා සංවර්ධනය

අටවැනි ප්‍රශ්නය සහ තවත් **එක්** ප්‍රශ්නයක් ද ඇතුළුව ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සපයන්න.

**9.** (i) ළදරුවකු අතිරේක ආහාරවලට හුරු කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.

(ii) "සමාජයේ ඇති නව ප්‍රවණතා දරුවාගේ සදාචාරාත්මක වර්ධනය කෙරෙහි බලපායි." විමසන්න.

(iii) පහත දක්වෙන චර්යාවලට හේතු විය හැකි කරුණු සාකච්ඡා කරන්න.

(a) අලුත උපන් නැගණියට මහත් ආදරයක් දක්වූ දිනූෂා අවුරුදු තුනක් වයසැති දැරියකි. මෑතක සිට ඇය නැගණියට පීඩාකාරී ලෙස හැසිරෙන්නී ය. ඇය නැවත ඇඳ තෙමීමට ද පටන්ගෙන ඇත.

(b) අවුරුදු 16 ක් වයසැති ප්‍රසාද් දෙමාපියන්ගේ ඇසුර වැඩිපුර අගය නොකළ **ද සමවයස් කණ්ඩායම් තුළ** හැසිරීමට මහත් ලැදියාවක් දක්වයි. නිවසේ දී නිතර ම තනිව සිටීමට ප්‍රිය කරයි. ඔහු සමහරවිට දෙමව්පියන්ගේ උපදෙස් හා අණ කිරීම් නුරුස්සන අතර ඒ කෙරෙහි ඇති අප්‍රසාදය දැඩි ප්‍රතිචාර මඟින් පෙන්වයි.

**10.** සාකච්ඡා කරන්න.

(i) පළමු වසර දෙක තුළ, දරුවන් රැකබලා ගැනීමේ දී වැඩිහිටියන් සතු කාර්යභාරය

(ii) දරුවන් සමාජයට යොමු කිරීම සඳහා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක ක්‍රියාකාරකම් සංවිධානය කිරීම

(iii) ළමාවියෙහි දරුවන්ගේ භාෂා හැකියා දියුණු කිරීම සඳහා පාසලෙහි දායකත්වය

(iv) යොවුන් විය ශීඝ්‍ර කායික වර්ධනයක් පෙන්වන අවධියකි.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**28 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ගෘහ ආර්ථික විද්‍යාව II
மனைப் பொருளியல் II
**Home Economics II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

විභාග අංකය: ....................................

* මෙම ප්‍රශ්න පත්‍රය 'අ' සහ 'ආ' යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වේ. කොටස් දෙකට ම නියමිත කාලය **පැය තුනකි.**
* 'අ' කොටසේ 1 වැනි ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **තුනක්** ද 'ආ' කොටසේ 6 වැනි ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන ප්‍රශ්න **හතකට** පිළිතුරු සපයන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ 'අ' කොටසේ 1 වැනි ප්‍රශ්නයටත්, 'ආ' කොටසේ 6 වැනි ප්‍රශ්නයටත් පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා වෙන් කොට, ඒවා සෙසු ප්‍රශ්නවල පිළිතුරු සමඟ අමුණා භාර දෙන්න.
* මෙම ප්‍රශ්න පත්‍රය කඩදාසි **දෙකකින්** යුක්ත වන අතර, අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 9කි.
* **පළමුවැනි** ප්‍රශ්නය 1, 2 සහ 3 වැනි පිටුවලත්, හයවැනි ප්‍රශ්නය 5 සහ 6 වැනි පිටුවලත් ඇත.

'අ' කොටස - රෙදිපිළි තාක්ෂණය

**පළමුවැනි** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **තුනක්** ද ඇතුළු ව ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

1. එක් එක් ප්‍රශ්නය සඳහා අදාළ පිළිතුරෙහි අංකය හෝ පිළිතුර හෝ **තිත් ඉර මත** ලියන්න.

1.1 පිළිස්සීමේ පරීක්ෂණ මගින් කෙඳි වර්ග හඳුනා ගැනීම හා සම්බන්ධ කරුණු කිහිපයක් පහත දක්වේ.

A - පිළිස්සීමෙන් පසු අළු පැහැති අළු ඉතිරි වේ.
B - පිළිස්සීමේ දී පිහාටු පිළිස්සෙන ගඳක් නිකුත් වේ.
C - දැල්ලට ඇල්ලූ විට අක්‍රමවත් ලෙස දැල්වේ. ඉවත් කළ විට නිවී යයි.
D - පිළිස්සීමේ දී පහසුවෙන් කැඩෙනසුලු, කළු පැහැති පබලු වැනි ද්‍රව්‍යයක් ඉතිරි වේ.
E - පිළිස්සීමේ දී කඩදාසි පිළිස්සෙන ගඳක් නිකුත් වේ.

මින් ලෝම කෙඳි හඳුනා ගැනීමට උපකාරී වන ලක්ෂණ ඇතුළත් වන්නේ,


(1) A, B හා C වල ය. (2) A හා C වල ය.
(3) B, C හා D වල ය. (4) A හා D වල ය.
(5) B, D හා E වල ය.

(.........)

1.2 නයිලෝන් කෙඳි නිෂ්පාදනයේ දී භාවිත වන අම්ලය නම් කරන්න.

..........................................................................................................

1.3 පහත දක්වා ඇති රූපවලින් හරස් දර වියමන සහ දහරහිරි වියමන පිළිබිඹු කෙරෙන රූප සටහන් තෝරන්න.



A B C D E

(1) A හා B (2) A හා C (3) B හා E
(4) C හා D (5) D හා E

(.........)

[ දෙවෙනි පිටුව බලන්න.

1.4 රෙදි නිෂ්පාදනයේ දී, වියමනක ශක්තිමත් බව නිර්ණය කරන සාධක **දෙකක්** ලියන්න.

(i) ..............................................................................................................................

(ii) ..............................................................................................................................

1.5 මහන යන්ත්‍රයෙන් මැසීමේ දී රෙද්ද පසුපසට තල්ලු වී නොයාමට හේතු **දෙකක්** දක්වන්න.

(i) ..............................................................................................................................

(ii) ..............................................................................................................................

1.6 පිරිමි කමිස නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(i) ..............................................................................................................................

(ii) ..............................................................................................................................

- අංක **1.7** සිට **1.10** තෙක් වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද අදාළ **කොටුව තුළ** ලකුණු කරන්න.

1.7 පතරොමක් නිර්මාණය කිරීමේ දී පතරොම වටා තැබිය යුතු මැහුම් වාසි එක සමාන විය යුතු ය. ☐

1.8 දක්කු රේඛා සලකුණු කිරීමේ දී, පතරොමත් රෙද්දත් අතර කාබන් කඩදාසිය තැබිය යුතු වේ. ☐

1.9 පීටර් පෑන් කරපටිය පැතලි කරපටියක් වන අතර කමිස කරපටිය උස් කරපටියකි. ☐


1.10 ඇඳුම් මැසීම සඳහා ගන්නා සියලු ම රෙදි වර්ග පෙර හැකිළවීමට භාජනය කළ යුතු ය. ☐

1.11 රෙද්දක් මත පතරොම ඇතිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු **දෙකක්** දක්වන්න.

(i) ..............................................................................................................................

(ii) ..............................................................................................................................

1.12 මෙම රූප සටහනෙන් දැක්වෙන්නේ



.............................................................................................. විවරයයි.

1.13 ආරෝපණ කිරීමේ දී භාවිත කරන මැස්ම **දෙකක්** නම් කරන්න.

(i) ..............................................................................................................................

(ii) ..............................................................................................................................

1.14 සායකට පිහිතල පොලොව් යෙදීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **දෙකක්** ලියන්න.

(i) ..............................................................................................................................

(ii) ..............................................................................................................................


1.15 නිර්ජල සේදීම සඳහා භාවිත කරන කාරක **දෙකක්** සඳහන් කරන්න.

(i) ..............................................................................................................................

(ii) ..............................................................................................................................

[ තුන්වෙනි පිටුව බලන්න.

1.16 මෙහි දක්වෙන්නේ අත් පන්නයක රූපසටහනකි.



එම අත් පන්නය නම් කරන්න. ..................................................

1.17 රෙදි පුරුකිම පිළිබඳ ව සිසුන් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.

A - ඇඳුමක ඇති ග්‍රීස් පැල්ලමක් ඉවත් කිරීම සඳහා ටර්පන්ටයින් භාවිත කරයි.
B - විරංජන කුඩු, මිල්ටන් සහ ප්‍රංශ හුණු පැල්ලම්හරණය සඳහා භාවිත කරන අවශෝෂක වේ.
C - උණු ජලයේ පෘෂ්ඨික ආතතියට වඩා ඇල් ජලයේ පෘෂ්ඨික ආතතිය අඩු ය.
D - රෙදිපිළි තණබිස්සක් මත වියළීමේ දී ඔක්සිහාරක විරංජනය සිදු වේ.
E - වීත්ත අණ්ඩයක් දැමීමේ දී අලුතින් යොදන රෙදි කැබැල්ල ඇඳුමේ හොඳපිටින් තැබිය යුතු ය.

මින් නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) A හා C ය.
(2) A හා E ය.
(3) B හා D ය.
(4) B හා E ය.
(5) C හා D ය.

(.........)

1.18 බොත්තම් කාස මැසීමේ දී අනුගමනය කළ යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(i) ......................................................................................................................

(ii) ......................................................................................................................

1.19 රෙදිපිළි මුද්‍රණය කිරීමේ ක්‍රම **දෙකක්** දක්වන්න.

(i) ......................................................................................................................

(ii) ......................................................................................................................

1.20 රෙද්දක ඇති වූ සිරස් කැපුමක් එලලීමෙන් අලුත්වැඩියා කරන ආකාරය රූප සටහන් මගින් දක්වන්න.

I පියවර

II පියවර

* *

The National e-learning Portal for The General Education

මෙතැනින් වෙන් කරන්න

[ හතරවෙනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**28 | S | II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ගෘහ ආර්ථික විද්‍යාව II
மனைப் பொருளியல் II
**Home Economics II**

* මෙම ප්‍රශ්න පත්‍රය 'අ' සහ 'ආ' යනුවෙන් කොටස් **දෙකකින්** යුක්ත වේ.
* **'අ' කොටසේ 1** වැනි ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **තුනක්** ද 'ආ' **කොටසේ** 6 වැනි ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **දෙකක්** ද තෝරා ගෙන ප්‍රශ්න **හතකට** පිළිතුරු සපයන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ 'අ' කොටසේ **1** වැනි ප්‍රශ්නයටත්, 'ආ' කොටසේ **6** වැනි ප්‍රශ්නයටත් පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා වෙන් කොට ඒවා සෙසු ප්‍රශ්නවල පිළිතුරු සමඟ අමුණා භාර දෙන්න.
* මෙම ප්‍රශ්න පත්‍රය කඩදාසි **දෙකකින්** යුක්ත වන අතර, අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව **9** කි.
* **පළමුවැනි** ප්‍රශ්නය **1**, **2** සහ **3** වැනි පිටුවලත්, **හයවැනි** ප්‍රශ්නය **5** සහ **6** වැනි පිටුවලත් ඇත.

## 'අ' කොටස - රෙදිපිළි තාක්ෂණය

**පළමුවැනි** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **තුනක්** ද ඇතුළු ව ප්‍රශ්න **හතරකට** පිළිතුරු **සපයන්න**.

2. (i) විවර පියවීමේ ක්‍රම **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** පැහැදිලි කරන්න.
   (ii) පිරිපුන් බව ලබා දෙන අත් පත්තයක් නිර්මාණය කරන්න.
   (iii) තනි පැහැ රෙද්දෙන් නිම වූ ගෘහ කබායක රවුම් හැඩයේ ඉම්කඩක් විසිතුරු කර ගන්නා අයුරු පැහැදිලි කරන්න.
   (iv) තිර රෙදි යෙදීමේ දී වාණිජමය ආධාරක භාවිත කිරීමෙන් වැඩි අලංකාරයක් ගෙන දේ. මෙම ආධාරක නම් කරන්න. ආධාරක උපයෝගී කර ගනිමින් තිර රෙදි යොදා ගන්නා **එක්** ආකාරයක් විස්තර කරන්න.

3. සටහන් ලියන්න.
   (i) ටෙන්ටරීකරණය
   (ii) ජලයේ තාවකාලික කඨිනත්වය
   (iii) සේද බරගැන්වීම
   (iv) ෆෙල්ට් කිරීම

4. (i) යෞවනියක සඳහා කදෙහි මූලික පතරොම සකස් කිරීමට අවශ්‍ය මිනුම් නම් කරන්න.
   (ii) කදෙහි ඉදිරිපස මූලික පතරොම නිර්මාණය කිරීමට අවශ්‍ය මිනුම් **තුනක්** ගණනය කරන්න. (දළ මිනුම් භාවිත කරන්න.)
   (iii) කදෙහි ඉදිරිපස මූලික පතරොම නිර්මාණය කරන අයුරු රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න.
   (iv) පෝරුවක් යොදා, සාරි හැට්ටයක් මැසීමේ දී අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ දක්වන්න.

5. පහත සඳහන් දෑ පැහැදිලි කරන්න.
   (i) රාත්‍රි ඇඳුම්වල තිබිය යුතු ලක්ෂණ
   (ii) ගෘහපිළි සහ ඇඳුම් සඳහා රෙදි තෝරා ගැනීමේ දී පාරිභෝගික දැනුවත්බවෙහි ඇති වැදගත්කම
   (iii) ආයිත්තම් වීම සඳහා උපාංග තෝරා ගැනීම
   (iv) ඇඳුම්වල ගුණාත්මක බව වැඩි කිරීම සඳහා මැසීමේ දී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග

[ පස්වෙනි පිටුව බලන්න.

5925

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු**
**(28) ගෘහ ආර්ථික විද්‍යාව II**

විභාග අංකය: ..............................

**'ආ' කොටස - ගෘහ කළමනාකරණය**

**හයවැනි** ප්‍රශ්නයත් තවත් ප්‍රශ්න **දෙකකුත්** ඇතුළත් වන සේ ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

6. එක් එක් ප්‍රශ්නය සඳහා අදාළ පිළිතුර **තිත් ඉර මත** ලියන්න.

6.1 නිවාස සැලසුම් කිරීමේ දී පෞද්ගලිකත්වය ආරක්ෂා කරගැනීම සඳහා ගත යුතු පියවර **දෙකක්** ලියන්න.

(i) ..............................................................................................

(ii) ..............................................................................................

6.2 නිවසක් ඉදිකිරීමේ දී අනුගමනය කළ යුතු නීතිමය කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(i) ..............................................................................................

(ii) ..............................................................................................

6.3 කාලය කළමනාකරණයේ දී අවධාරණය කළ යුතු කරුණු **දෙකක්** ලියන්න.

(i) ..............................................................................................

(ii) ..............................................................................................

6.4 උපගෘහයක් සැලසුම් කිරීමේ දී වැදගත් වන කරුණු **දෙකක්** ලියන්න.

(i) ..............................................................................................

(ii) ..............................................................................................

6.5 බොහෝ නිවෙස්වල භාවිත වන දර ලිපෙහි කාර්යක්ෂමතාව අඩු වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.

(i) ..............................................................................................

(ii) ..............................................................................................

6.6 'ප්‍රදීපනය' හඳුන්වන්න.

..............................................................................................

- අංක **6.7** සිට **6.11** තෙක් වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද අදාළ **කොටුව තුළ** ලකුණු කරන්න.

6.7 චිමිනි ලාම්පුවක සංවහන ධාරා හොඳින් ඇති කිරීම සඳහා සිහින්, උස් චිමිනියක් යෙදීම සුදුසු වේ. ☐

6.8 ජීව වායුවෙහි ප්‍රධාන වශයෙන් අඩංගු වන්නේ ඊතේන් ය. ☐

6.9 කාමරයක එකිනෙකට යාබද බිත්ති දෙකක පිහිටා ඇති ජනේල හා වා කවුළු මගින් හරස් සංවාතනය සිදුවේ. ☐

6.10 යකඩ මෙවලම්වල මල බැඳීම වැළැක්වීම සඳහා ගැල්වනයිස් කිරීමේ දී තඹ ආලේප කරනු ලැබේ. ☐

6.11 නිර්මාණයක ඇති සිරස් රේඛා මගින් තිර බව මෙන් ම ක්‍රියාශීලී බව ද පිළිබිඹු වේ. ☐

The National e-learning Portal for The General Education

6.12 ක්ෂුද්‍ර තරංග උදුනක් භාවිතයේ දී අවධාරණය කළ යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(i) ..........................................................................................................

(ii) ..........................................................................................................

6.13 නිවසේ භාවිත වන බහුකාර්ය ගෘහ භාණ්ඩ **දෙකක්** නම් කරන්න.

(i) ................................................ (ii) ................................................

6.14 විදුලි ස්ත්‍රික්කයක ස්වයංක්‍රීය තාප පාලකය ලෙස ක්‍රියා කරනුයේ එහි ඇති ................................ ය.

6.15 තාප දීප්ත විදුලි බල්බයක ඇතුළත පිරවීම සඳහා යොද ගත හැකි වායුවකි, ................................

6.16 පීඩන උදුනේ රබර් වළල්ලෙන් (gasket) ඉටුවන කාර්යය කුමක් ද?

..........................................................................................................

6.17 පහත දක්වෙනුයේ නිවසක විවිධ කොටස් සඳහා වර්ණ යොද ගැනීම හා සම්බන්ධව සිසු කණ්ඩායමක් විසින් කරන ලද ප්‍රකාශ කිහිපයකි.

A - කාමර වර්ණ ගැන්වීමේ දී අනෙකුත් වර්ණ සමග උදාසීන වර්ණ ද යොද ගත හැකි ය.

B - ලා පැහැයන් අගමානයේ ඉහළින් දක්වේ.

C - නිදන කාමර සඳහා අඳුරු වර්ණ යෝග්‍ය වේ.

D - කොළ, දම්, නිල් වැනි වර්ණ කාමරයකට සිසිල් බවක් ගෙන දේ.

E - ආලින්දය සඳහා තද පැහැ වර්ණ භාවිත කිරීම වැදගත් ය.

මින් නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) A, B හා D ය. (2) A, C හා E ය. (3) B, C හා D ය.
(4) B, D හා E ය. (5) C, D හා E ය. (.........)

6.18 කෑම මේසයෙහි මැදට තැබීම සඳහා උචිත මල් සැකසුමක් අඳින්න.

6.19 'වර්ණ මගින් කාමරයක ප්‍රමාණය හා හැඩය වෙනස් කර පෙන්වන හැකියාවක් ඇති කළ හැකි ය.' මීටර 3.7 × මීටර 2.5 (12′ × 8′) ප්‍රමාණයේ කාමරයක් සමචතුරස්‍රාකාර ලෙස පිළිබිඹු කිරීම සඳහා නිල් වර්ණය යොද ගත හැකි වන්නේ කෙසේ ද?

..........................................................................................................

..........................................................................................................

6.20 කුණුකසළ බැහැර කරලීම සඳහා පිළිස්සීම සුදුසු ක්‍රමයක් නොවේ. මීට හේතුව කුමක් ද?

..........................................................................................................

..........................................................................................................

**

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
*All Rights Reserved]*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**28 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ගෘහ ආර්ථික විද්‍යාව II
மனைப் பொருளியல் II
**Home Economics II**

**'ආ' කොටස - ගෘහ කළමනාකරණය**

**හයවැනි** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **දෙකක්** ද ඇතුළු ව ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

**7.** පවුලක්, මව, පියා, පාසල් වියෙහි පසුවන දියණියන් දෙදෙනෙකු සහ පුතෙකුගෙන් සමන්විත වේ. ඔවුන් සඳහා නිවසක් ඉදිකිරීමට තීරණය කර ඇත.

(i) එම නිවස ඉදිකිරීමේ දී, වියදම් අඩු කර ගැනීමට ගත හැකි පියවර ඉදිරිපත් කරන්න.

(ii) මෙම පවුලට යෝග්‍ය නිවසක් සඳහා බිම් සැලසුමක දළ සටහනක් අඳින්න. කාමර නම් කිරීම, දොර ජනේල පිහිටි ස්ථාන පෙන්නුම් කිරීම අවශ්‍ය වේ. (පරිමාණයට ඇඳීම අවශ්‍ය නොවේ.)

(iii) මෙම නිවසෙහි එක් නිදන කාමරයක බිම් සැලසුම පරිමාණයකට අඳින්න. (පරිමාණය සඳහන් කිරීම අපේක්ෂා කෙරේ.)

**8.** (i) ගෘහීය විද්‍යුත් පරිපථයක කොටස් නම් කරන්න.

(ii) විදුලි කේතලයක භාවිතය හා එය නඩත්තු කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.

(iii) කෙටියෙන් පැහැදිලි කරන්න.

(a) ගෘහීය කාර්යයන්හි දී ඝර්ෂණයෙහි වාසි හා අවාසි

(b) කොම්පෝස්ට් සෑදීම

(c) ගෘහීය කාර්යයන්හි දී ශ්‍රම විභජනය

**9.** (i) මුළුතැන් ගෙයක වැඩ ඒකක සංවිධානය කර ගැනීමේ දී සැලකිය යුතු කරුණු **තුනක්** ලියන්න.

(ii) 'විවිධාකාර ලෙස රිද්මය යොදා ගැනීමෙන් ගෘහ අභ්‍යන්තර අලංකරණය වර්ධනය කර ගත හැකි ය.' නිවස තුළ රිද්මය පෙන්නුම් කරන විවිධ ආකාර **තුනක්** රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(iii) කෑම කාමරය සඳහා අනුපූරක වර්ණ ගැළපුමක් (ප්‍රතිවිරුද්ධ වර්ණ ගැළපුමක්) යොදා ගන්නා ආකාරය විස්තර කරන්න.

(iv) හේතු පහදන්න.

(a) මැටි ගුරුලේත්තුවක ජලය සිසිල්ව පවතී.

(b) වැසිකිළි බඳුන පිරිසිදු කිරීම සඳහා ක්ෂාලක යෙදීම සුදුසු නොවේ.

* * *